ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ලියාපදිංචි වී

# විදේශ රැකියාවක නිරතව සිට මෙරටට පැමිණෙන ඔබ සඳහා

# ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවක නිරතව සිට නැවත මෙරටට පැමිණ, ව්‍යාපාරයක නිරතව සිටින විගමනික ශ්‍රමිකයින්ගේ ව්‍යාපාර /කර්මාන්ත වැඩිදියුණු කර ගැනීමට මෙන්ම විදේශ රැකියාවෙහි නිරතව උපයාගත් මුදලින් ව්‍යාපාර/ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මූල්‍යමය වශයෙන් විගමනික ශ්‍රමිකයින් සවිබල ගැන්වීම වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යවසායකයින් බිහිකිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.

මෙරටට පැමිණ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් ආරම්භ කිරීමට අවශ්‍ය විගමනික ශ්‍රමිකයින් විසින් තම ව්‍යාපාරය/කර්මාන්තය වෙනුවෙන් සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) මගින් අදාළ පළාත් කාර්යාලය වෙත යොමුකළ යුතු අතර, යෝජිත ශක්‍යතා ඇගයීමේ කමිටුව හරහා සුදුසු ප්‍රතිලාභීන් තෝරාගනු ලැබේ.

**මූල්‍ය ආධාර ඉල්ලුම් කිරීම සඳහා ඉල්ලුම්කරු සපුරා තිබිය යුතු සුදුසුකම්.**

- කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගෙන අවම වසර 02ක විදේශ රැකියාවක නියුතුව සිට ආපසු ශ්‍රී ලංකාවට පැමිණ ව්‍යාපාර/කර්මාන්තයක් දැනට පවත්වාගෙන යන හෝ අලුතින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති විගමනික ශ්‍රමිකයෙකු විය යුතුය.

**ඉදිරිපත් කළයුතු ලේඛන**

- විගමනික ශ්‍රමිකයාගේ විදේශ ගමන් බලපත්‍රයේ ජායාරූපය සහිත පිටුවේ සහ නැවත පැමිණි දිනය සටහන් ආගමන විගමන මුද්‍රා සටහන් කර ඇති පිටුවල සහතික කළ ජායා පිටපත්.
- ජාතික හැඳුනුම්පතේ සහතික කළ ජායා පිටපතක්.
- ව්‍යාපාරයේ / කර්මාන්තයේ දළ සැලැස්මක්.
- සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනා / ව්‍යාපාර සැලැස්මේ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමක් හෝ පවතින ව්‍යාපාරයක් වැඩි දියුණු කිරීමක් සඳහා විය යුතුය.

නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර පුළුල් කිරීමට යෝජනාවේ ශක්‍යතාව තක්සේරු කිරීම මත පදනම්ව පහත සඳහන් මූල්‍ය ප්‍රදානයන් ලබාදීමට අපේක්ෂා කෙරේ.

| නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් ව්‍යාපාර/කර්මාන්ත සඳහා අපේක්ෂිත හෝ දැනට සිදුකර ඇති ආයෝජන | කාර්යංශය මගින් එක් ව්‍යවසායකයෙකු වෙත ලබාදෙනු ලබන ප්‍රදානය | එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක් යටතේ වෙන් කළ ප්‍රදාන සංඛ්‍යාව |
|---|---|---|
| රු .200,000 - 500,000 | රු. 250,000 | 3 |
| රු. 500,001 - 1,000,000 | රු. 500,000 | 1 |
| රු. 1, 000,000 වැඩි | රු. 1, 000,000 | 1 |

- ව්‍යාපාර යෝජනා ඇගයීමේදී නිෂ්පාදන හා අපනයන ඉලක්ක කරගත් ව්‍යාපාර සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.
- ව්‍යාපාර යෝජනා ඇගයීමේදී ව්‍යාපාරය හරහා උත්පාදනය වන සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සංඛ්‍යාව පිළිබඳව විශේෂ අවධානය යොමු කෙරේ.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය**
**2025.02.28**

ඉල්ලුම්කරුවන් විසින් සකස් කරනු ලබන ව්‍යාපෘති යෝජනා
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) වෙත යොමු කළ යුතුය.

සම්බන්ධීකරණය හා වැඩි විස්තර -

- මෙහෙවර පියස, ප්‍රත්‍යානුකලන අංශය - 011 2365673
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි ව්‍යවසායකත්ව සහය කවුළුව - 011 2251688
- පැය 24 ක්ෂණික ඇමතුම් අංශය - 1989
- වෙබ් අඩවිය - www.slbfe.lk

මේ පිළිබඳව වැඩි විස්තර කාර්යාංශයේ පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථාන මගින් ද ලබාගත හැකිය.

| | | |
|---|---|---|
| මතුගම - 034 2247188 | හාලිඇල - 055 2294118 | අනුරාධපුර - 025 2225290 |
| රත්නපුර - 045 2223077 | අම්පාර - 063 2223413 | වව්නියාව - 024 2228608 |
| මහනුවර - 081 2227012 | කුරුණෑගල - 037 2223661 | තංගල්ල - 047 2241477 |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
එතෙර සවියට මෙතෙර අත්වැල